**චාවකච්චේරි නගර සභාව - 2023**
**------------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

චාවකච්චේරි නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට චාවකච්චේරි නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.

සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභා අරමුදලින් සිදුකළ ගොඩනැගිලි 06ක මූලධන ප්‍රතිසංස්කරණ කාර්යයන්හි පිරිවැය එකතුව රු.5,296,037ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේ එම ව්‍යාපෘති ඇතුළත් කිරීමට කටයුතු කර ඇති බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | වැඩ අවසන් නොවූ ඉදිකිරීම් 06කට අදාල එකතුව රු.1,699,794ක ඇස්තෙමේන්තුගත පිරිවැය ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණි. | අදාල කාර්යයන් මෙම වර්ෂයේ සිදුකිරීමට පියවර ගනු ලබන බව. | -එම- |
| (ඇ) | විෂයයන් 02කින් ලැබිය යුතු එකතුව රු.134,100ක ශේෂ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | හිඟහිටි ශේෂය අයකර ගැනීමට පියවර ගෙන ඇති බව. | -එම- |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගබඩා ලෙජරයට අනුව 2023 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ ශේෂය හා මූල්‍ය ප්‍රකාශන අනුව එදිනට එම ශේෂය අතර රු. 7,879,705ක වෙනසක් පැවතිණි. | කපා හැරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල ශේෂ අදාළ ප්‍රභව ලියවිලි සමඟ සැසඳිය හැකි විය යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.14,089,414ක් වූ හිඟහිටි වරිපනම් බදු සහ විවිධ ණයහිමි ශේෂවල ලැයිස්තු හා කාල විශ්ලේෂණය විගණනයට ඉදිරිපත් නොකිරීමෙන් සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය. | මෙම මූල්‍ය වර්ෂයේ ගැලපීමට පියවර ගෙන ඇති බව. | ලැයිස්තු හා කාල විශ්ලේෂණ පිළියෙල කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනතේ 255 පරිච්ඡේදයේ 160(1) වගන්තිය | සමාලෝචිත වර්ෂයේ සභාව විසින් වරිපනම් හා බදු අයකළ යුතු දේපළ 11,670කින් දේපළ 2,961ක් සඳහා K ආකෘති පත්‍ර බෙදා හැර නොතිබුණි. | දේපළ හිමිකරුවන් විදේශගතවීම් හා වෙනත් ප්‍රදේශයන්හි පදිංචිවීම් හේතුවෙන් ඒවා ලබාදීමට නොහැකි වූ බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(1), (2) හා (3) | වර්ෂ 02කට වඩා පැරණි එකතුව රු.244,470ක කල් ඉකුත් වූ තැන්පතු 41ක් නිරවුල් කර නොතිබුණි. | සිහිකැඳවීම් ලිපි යැවීමට කටයුතු සිදුකරමින් පවතී. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 76,124,474ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.67,424,605 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 7,430,000 | 8,052,794 | 9,056,496 | 13,011,663 | 6,585,000 | 6,629,224 | 3,090,821 | 14,015,365 |
| කුලී | 25,164,600 | 38,272,015 | 38,385,545 | 899,849 | 35,069,800 | 36,283,219 | 35,067,785 | 1,013,379 |
| බලපත්‍ර ගාස්තු | 984,500 | 1,048,528 | 1,048,528 | - | 1,019,500 | 1,019,075 | 1,019,075 | - |
| වෙනත් ආදායම් | 30,607,500 | 53,213,266 | 45,635,161 | 18,391,902 | 39,831,086 | 49,348,002 | 42,415,961 | 10,813,797 |
| එකතුව | **64,186,600** | **100,586,603** | **94,125,730** | **32,303,414** | **82,505,386** | **93,315,520** | **81,593,642** | **25,842,541** |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට දේපළ 7,136කින් අයකළ යුතුව තිබූ හිඟහිටි වරිපනම් බදු එකතුව රු. 11,363,597ක් වූ ශේෂය හා කඩකාමර 05කින් හිඟහිටි කුලී රු. 131,850 ක් වසර 10කට වඩා පැරණි ශේෂයන් විය. එමෙන්ම, රු.2,678,345ක ලැබිය යුතු මුද්දර ගාස්තු ශේෂය වසර 13 කට වඩා පැරණි විය. | අයකිරීමට සහ කපාහැරීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | හිඟහිටි ශේෂ නොපමාව අයකළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභා බැංකු ජංගම ගිණුමේ පවතින රු.59,339,581 ක ශේෂය ආදායම් ඉපැයීමේ මූලාශ්‍රවල යෙදවීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අවධානය යොමු කරනු ලබන බව. | ආදායම් ඉපැයීමේ මූලාශ්‍රයන්හි යෙදවීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | වර්ෂ 03කට වරක් අළුත් කළයුතු කඩකාමර 37ක දීර්ඝකාලීන කුලී ගිවිසුම් එලෙස අළුත් නොකර අඛණ්ඩව පසුගිය වර්ෂ 08 සිට 43ක් දක්වා කාලයක් පවත්වාගෙන ගොස් තිබුණි. | ගිවිසුම් අළුත්කිරිමට කටයුතු කරමින් පවතින බව. | කුලී ගිවිසුම් නියමිත කාලවකවානු තුළ අළුත්කිරිමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | සභාව සතු කඩකාමර 02ක් බදු නොදීමෙන් ආසන්න වශයෙන් රු.3,074,050ක ආදායම් අහිමි වී තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | බදුදීමට පියවර ගත යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එකතුව රු. 72,150,000ක් වූ ඉඩම් 06ක් හා ළිං 29ක් ස්ථාවර වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණද, ඒවායේ අයිතිය සභාව සතුව නොපැවතිණි. | සභාවට පවරා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | වත්කම්වල අයිතිය නිරවුල් විය යුතුය. |
| (ආ) | 2015 දෙසැම්බර් 30 දිනැති අංක 2016/01 දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛයේ 1.1 ඡේදයට අනනුකූලව, සභාව සතු නොවූ ඉඩම්වල පැවැති ගොඩනැගිලි 08ක් රු.7,270,377ක් වැයකර ප්‍රතිසංස්කරණය කර තිබුණි. | හිමිකම් ඔප්පු ලබා ගැනීමට පියවර ගෙන ඇති බව. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර තිබූ අයවැය ප්‍රකාරව ඇස්තෙමින්තු ගත ආදායම් සහ වියදම් හා තථ්‍ය ආදායම් සහ වියදම් සමග සැසඳීමේදි ආදායම් විෂයන් 03ක සියයට 46ක සිට සියයට 101ක් දක්වාත්, වැය විෂයන් 06ක සියයට 14ක සිට සියයට 87ක් දක්වාත් මූලධන වැය විෂයක සියයට 106ක විචලනයක්ද පැවැතිම හේතුවෙන් අයවැය, ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණි. | 2024 වර්ෂයේ සිට ක්‍රියාමාර්ග ගනු ලබන බව. | අවශ්‍යතා හඳුනාගෙන සැලැකිලිමත් ලෙස අයවැය සකස් කළ යුතුය. |

### 4.2 පාරිසරික ගැටළු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 වර්ෂයේ පිළිසරු ව්‍යාපෘතිය යටතේ කාබනික පොහොර නිෂ්පාදනය සඳහා රු. මිලියන 4.69ක පිරිවැයකට ඉඩමක් සහ පරිත්‍යාග ලැබූ කසල ඇඹරීමේ යන්ත්‍ර ආදිය අභාවිත තත්ත්වයෙන් පැවැතුණි. එසේම, රැස්කරනු ලබන අපද්‍රව්‍ය දිරන හා නොදිරන වශයෙන් වර්ගීකරණය නොකර අවිධිමත් අන්දමින් ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ බැහැර කර තිබුණි. | ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | කාබනික පොහොර නිෂ්පාදනයට අවධානය යොමුකළ යුතුය. |
| (ආ) | ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා තෝරාගත් ප්‍රදේශයේ මදුරුවන් බෝවීම මර්දනයට මැසි තෙල් ඉසීම හා දුරගන්ධය නැති කිරීමට සුදුසු ක්‍රියාමාර්ග පසුගිය වර්ෂ 02ක කාලයක සිට ගෙන නොතිබුණි. | ඉදිරියේදී සිදුකෙරෙන බව. | පරිසරයට හිතකාමී අයුරින් කසල බැහැර කළ යුතුය. |